www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සසප, සිවප්‍රගාසම් මරියදාස් ඝාතනය පිලිබඳව පූර්න පරීක්ෂනයක් ඉල්ලයි

## Sri Lankan SEP demands full investigation into murder of Sivapragasam Mariyadas

**සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශය**
**2006 සැප්තැම්බර් 05**

පසුගිය අගෝස්තු 7 දා නැගෙනහිර පලාතේ ත්‍රිකුනාමලයේ දී තම ආධාරකරුවකු වන සිවප්‍රගාසම් මරියදාස් ඝාතනය කිරීම ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප) හා ලෝක සමාජවාදී වෙබ් අඩවිය (ලෝසවෙඅ) තරයේ හෙලා දකී. ඝාතනය පිලිබඳව පූර්න පරීක්ෂනයක් පවත්වන ලෙස ද අපරාධයට වගකිවයුත්තන් අධිකරනය ඉදිරියට පමුනුවා දඬුවම් පමුනුවන ලෙස ද ඉල්ලා අප කරන උද්ඝෝෂනයට සහය දෙන ලෙස අපගේ සියලු ආධාරකරුවන්ගෙන් ද පාඨකයන්ගෙන් ද ඉල්ලා සිටිමු.

අද වන විට හෙලිදරව් වී ඇති සියලු සාක්ෂිවලින් පෙනී යන්නේ, ඝාතකයන් ශ්‍රී ලංකාවේ මිලිටරියේ, පොලීසියේ හෝ ඔවුන් සමග එක්ව කටයුතු කරන අර්ධ-මිලිටරි කන්ඩායම්වල සාමාජිකයන් බව සහ මරියදාස්ගේ ඝාතනය වනාහි, ජනාධිපති රාජපක්ෂගේ ආන්ඩුව රට නැවත සිවිල් යුද්ධයට ඇද ගෙන යන තතු තුල උතුරු-නැගෙනහිර මහජනතාව බිය වැද්දීමට හා ත්‍රස්ත කිරීමට ගෙන යන විෂඝෝර උද්ඝෝෂනයේ කොටසක් බවයි. මෙම උද්ඝෝෂනයේ අරමුන යුද්ධයේ දැනුවත් විරුද්ධවාදීන් නිහඬ කිරීමයි.

වෘත්තියෙන් ඡායාරූප ශිල්පියෙකු වූ තිස් දෙහැවිරිදි මරියදාස් ත්‍රිකුනාමලයේ සිට කිමී 20ක් දකුනෙන් පිහිටි මුල්ලිපොතාන නම් වූ ගම්බද නගරයේ ඡායාරූපාගාරයක් ද දුරකථන මධ්‍යස්ථානයක් ද පවත්වා ගෙන ගියේ ය. දිනපතා වැඩට පැමිනීමේ දී ඇති වූ ගමනාගමන දුෂ්කරතා හේතුවෙන් මරනයට දින හතකට කලින් ඔහු තම බිරිය ස්ටෙලා ක්‍රිෂාන්ති මරියදාස් හා තුන් හැවිරිදි පිරිමි දරුවා සමග නගරයට සංක්‍රමනය විය.

අගෝස්තු 7 දා රාත්‍රියේ 7.45ට පමන මරියදාස් තම නිවසට පැමිනියේ ය. රාත්‍රි ආහාරයෙන් මොහොතකට පසු, 9.30ට පමන යමෙකු දෙමල බසින් "මරියදාස් අන්නා" (මරියදාස් අයියා) යනුවෙන් අමතනු ඇසී ඔහු දොරටුව වෙතට ගමන් කලේ ය. ඔහු දොරටුවට ලගා වූ සැනින් තුවක්කුකරුවෙකු විසින් ඔහුගේ නලලටත් බෙල්ලටත් වෙඩි තබා ඔහු එතැන දී ම මරා දැමීන.

වෙඩි හඬ ඇසී කුස්සියේ සිට දුව ආ ඔහුගේ බිරිය ස්ටෙලා ක්‍රිෂාන්තිට දැක ගත හැකි වූයේ බිම වැටී සිටි මරියදාස් ය. ටී ෂර්ටයක් සහ කොට කලිසමක් හැඳ හෙල්මට් පැලැඳ සිටි ඝාතකයා නිවසේ සිට ගේට්ටුව වෙතට දුව යනු ඇය දුටුවා ය. මිනීමරුවා තාප්පයෙන් පැන ඔහු එනතුරු නවතා ගෙන සිටි යතුරු පැදියක නැගී පලා ගියේ ය.



උදව් ඉල්ලා ක්‍රිෂාන්ති නැගූ හඬ ඇසුනු අසල්වැසියන් ග්‍රාමාරක්ෂක භටයින් දෙදෙනෙකු ද සමග නිවෙසට පැමිනි අතර ඉන් පැය භාගයකට පසු තඹල්ගමුව පොලීසියේ නිලධාරීහු එතැනට පැමිනියහ. ක්‍රිෂාන්තිගෙන් ප්‍රකාශයක් සටහන් කරගත් පොලිස් නිලධාරීහු ඉන් කිලෝ මීටර් 10ක් දුරින් පිහිටි කන්තලේ රෝහලට මරියදාස්ගේ සිරුර රැගෙන ගියහ. පසු දින රෝහලේ දී මහේස්ත්‍රාත් පරීක්ෂනය සිදු කෙරුනු අතර හුරු පුරුදු තීන්දුවක් ප්‍රකාශයට පත් කෙරින: නොහඳුනන තුවක්කුකරුවෙකු විසින් එල්ල කරන ලද වෙඩි පහරවලින් ඇතිවූ තුවාල හේතුවෙන් මරනය සිදුව ඇත. බැරෑරුම් පරීක්ෂනයක් නම් සිදු වන්නේ නැත.

මිනී මැරුමේ වටපිටාවෙන් පෙන්නුම් කෙරෙනුයේ එය ආරක්ෂක හමුදාවන්ගේ හෝ අර්ධ-මිලිටරි මැර කල්ලිවල සාමාජිකයින් විසින් සිදු කරන ලද වෘත්තීමය හා ඉලක්ක ගත ඝාතනයක් බවයි. සමස්ත ප්‍රදේශයම යුද කලාපයක මධ්‍යයේ පිහිටා ඇති අතර හමුදා භටයින්ගේ, පොලීසියේ සහ ග්‍රාමාරක්ෂකයින්ගේ මුර සංචාරවලින් ගහනය. රාත්‍රියේ මහමග ගමන් කරන

කවරෙකු හෝ මාර්ග බාධකයන්හි දී ආරක්ෂක සෝදිසි කිරීම්වලට ලක් වීම සාමාන්‍ය දෙයකි.

ඝාතනය සිදු වූයේ මුල්ලිපොතානට කිමී 50ක් නැගෙනහිරෙන් වූ මුත්තූර්හි දරුනු සටන් ඇවිලී ක්ෂනික ඉක්බිත්තෙහි ය. ජනාධිපති රාජපක්ෂ, 2002 සටන් විරාමය විවෘතවම උල්ලංඝනය කරමින්, කැරලිකරුවන්ගේ භූමි ප්‍රදේශයේ පිහිටි මාවිල්ආරු සොරොව්ව අල්ලා ගැනීමට ජූලි 26 වන දා මූලික ප්‍රහාරයක් දියත් කලේ ය. අගෝස්තු 1 දා, හමුදාවේ සැපයුම් මාර්ග කපා හැරීමේ තර්ජනය මතු කරමින්, ආන්ඩුව මගින් පාලිත මුත්තූර් නගරයට ඇතුලුවීමෙන් දෙමල විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) එකට-එක කලේ ය.

මිලිටරියෙන් එක දිගට එල්ල කෙරුනු කාල තුවක්කු සහ රොකට් ප්‍රහාර හේතුවෙන් බහුතරයක් මුස්ලිම් වන දස දහස් ගනන් නිවැසියන් පලා ගිය අතර අවසානයේ දී නැවත නගරයේ පාලනය ආන්ඩුව අතට ගැනින. මරියදාස්ගේ නිවෙස පිහිටා තිබුනේ මුත්තූර් නගරයෙන් පලා ආ සරනාගතයින් ලැගුම් ගෙන සිටි මුස්ලිම් පාසැලකට මීටර් කීපයක් නුදුරිනි. මුල්ලිපොතාන තුල සෑම තැනෙකම හමුදා භටයින් සිටි අතර ඔවුහු ත්‍රිකුනාමල-කන්තලේ ප්‍රධාන මාර්ගයෙහි නිරන්තර මුර සංචාරයෙහි යෙදෙමින් සිටියහ. මීට අමතරව මැනවින් සන්නද්ධ වූ සෙබලුන් පාසැලෙහි ද රඳවා තිබුනි.

මරියදාස්ගේ මරනයට දින දෙකකට කලින්, අගෝස්තු 5 දා, ප්‍රංශය පදනම් කරගත් ඇක්ෂන් කොන්ට්‍රෙ ලා ෆේම් (ඒසීඑෆ්) සංවිධානයට සම්බන්ධිත ප්‍රාදේශීය සහන සේවකයින් 17 දෙනෙකුගේ මල සිරුරු මුත්තූර්හි දී හමුවිය. ඉන් සිරුරු 15ක් ඒසීඑෆ් සංකීර්නය අසල පෙල ගසා තිබූ අතර ඒ සෑම කෙනෙකුම මරා දමා තිබුනේ හිසට වෙඩි තැබීමෙනි. අනෙක් දෙදෙනා ගැලවී පලා යාමට තැත් කරද්දී පිටු පසට තබන ලද වෙඩි පහරවලින් මිය ගොස් තිබුනි. තමාගේම පරීක්ෂනයක් ගෙන ගිය ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුව (එස්එල්එම්එම්) ඝාතන සම්බන්ධයෙන් මිලිටරිය වග කිවයුතු බැව් අගෝස්තු 30 වන දා නිල වසයෙන් ප්‍රකාශයට පත් කලේය.

පසුගිය නොවැම්බරයේ දී රාජපක්ෂගේ තේරී පත් වීමෙන් පසු සිදු කෙරුනු බොහෝ ජන ඝාතනවලින් එකක් වන මුත්තූර් ඝාතනයෙන් යුද්ධයේ වාර්ගික ස්වභාවය මනාව පිලිබිඹු කෙරේ. සිංහල ස්වෝත්තමවාදය තුල ගැඹුරු ලෙස ගිලී සිටින ආරක්ෂක හමුදාවන් දෙමල සුලුතරයට සලකන්නේ සතුරන් ලෙස ය. සිංහල අන්තවාදී පක්ෂ උතුරු සහ නැගෙනහිර පලාත්වල මෙහෙයුම් ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන "කොටි ආධාරකරුවන්" නැවත නැවතත් හෙලා දැක ඇත.

මෙම විෂසෝර දේශපාලන වාතාවරනය මධ්‍යයේ මරියදාස් මරා දැමින. ත්‍රිකුනාමලයට ආසන්න සෙල්වනායගපුරම් නම් වූ ඔහුගේ උපන් ගමේ දී අගෝස්තු 9 දා සිදු කෙරුනු අවමංගල්‍යයේ දී, එයට සහභාගී වීමට පැමිනි ජනයා ඉන් ඉවත් කර තැබීම සඳහා යතුරු පැදිවලින් එම ප්‍රදේශයේ මුර සංචාරයේ යෙදුනු ආරක්ෂක හමුදාවෝ උත්සාහ කලහ. හමුදා භටයෝ සිංහල ජනයාට මෙසේ පැවසූහ: "එල්ටීටීඊකාරයෙකුගෙ මරනෙට සහභාගි වෙන්න ඇයි? තමුසෙලාට එහේ යන්න පුලුවන්. ඒත් අපි බලමු ආපහු එන කොට තමුසෙලා යන්නෙ කොහේද කියල."

මුල්ලිපොතාන හමුදා භටයෝ ද මෙවැනිම බොරු වැපුරූහ: එනම් මරියදාස් එල්ටීටීඊ සාමාජිකයකුව සිටි බවත් ඒ අනුව අවමගුලේ දී ඔහුට එල්ටීටීඊ පදක්කමක් පිරිනැමුනු බවත් ය. බිය වැද්දීමට දරන ලද උත්සාහයන් නොතකා සිංහල හා දෙමල 500ක් පමන ජනයා මරියදාස්ට ඔවුනගේ ගෞරවය දැක්වීම සඳහා අවමගුලට සහභාගි වූහ. අනුනට උදව් උපකාර කරන සහ සමාජ වැඩ කටයුතු සංවිධානය කරන කෙනෙකු ලෙස ප්‍රසිද්ධ මරියදාස් ජනප්‍රිය තරුනයෙක් විය.

මරියදාස් එල්ටීටීඊ සාමාජිකයෙක් නොවී ය. ඔහු සසප දේශපාලන ක්‍රියාකාරකම්වලට එලිපිට සම්බන්ධ නොවූ නමුදු ඔහු එකගව සිටියේ පක්ෂයේ දේශපාලන ක්‍රියා මාර්ගයට මිස එල්ටීටීඊයේ බෙදුම්වාදී ඉදිරි දර්ශනයට නොවේ. 1983 දී යුද්ධය ඇරැඹුනු තැන් පටන් එයට විරුද්ධ වෙමින් සහ ශ්‍රී ලංකා සහ ඊලාම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා දෙමල, සිංහල හා මුස්ලිම් කම්කරු ජනයාගේ එකමුතුව සඳහා සටන් වදිමින් සසප සහ එහි පෙර ගමන්කරු විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය ගෙන ගිය දීර්ඝ අරගලය සම්බන්ධයෙන් මරියදාස්ට අති මහත් ගෞරවයක් තිබුනි.

මරියදාස් හා සසප අතර සබඳතා ඇරැඹුනේ පස් වසරකට පෙර ය. ඔහු *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* දෙමලෙන් පලවූ ලිපි ඉතා ඕනෑකමින් කියවූ අතර හැකි සෑම විටෙකම එම වෙබ් අඩවියේ වාර්තාකරුවනට ආධාර කලේ ය. අපගේ මාධ්‍යවේදීනට ඔහු සහ ඔහුගේ පවුල ආහාරපාන සහ නවාතැන් පහසුකම් සම්පාදනය කර දුන්හ. ඔවුනට පැවරී ඇති කාර්යය අවදානම් යැයි ඔහුට හැඟුන හොත් ඔහුගේ සහාය ඔවුනට ලබාදීමේ සූදානම ඔහු නිරතුරුව අවධාරනය කලේ ය. ඔහුට තිබූ පුලුල් මිත්‍ර ජාලයේ සහ සබඳතාවන්ගේ මහිමයෙන් ඕනෑම විටෙක තොරතුරු සොයා ගැනීමේ සහ සම්මුඛ සාකච්ඡා සූදානම් කිරීමේ හැකියාව ඔහු සතුව තිබුනි. ඔහුගේ මරනයෙන් දින කීපයකට පෙර මුත්තූර්හි සිට පැමිනි සරනාගතයෙකු හා *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* අතර සම්මුඛ සාකච්ඡාවක් ඔහු සංවිධානය කලේ ය.

ශ්‍රී ලංකාවේ සිදුවෙමින් පවත්නා දෑ පිලිබඳ සත්‍ය චිත්‍රයක් ජාත්‍යන්තර ප්‍රේක්ෂකයට ලබා දීමට ඔහුට අවශ්‍ය විය.

යුද්ධයට ඔහුගේ ඇති විරුද්ධත්වය ඔහු ඉතා සරලව සම්පින්ඩනය කලේය: "බලන්න, සිංහල, දෙමල සහ මුස්ලිම් අපි සමීප බැඳීම් සහ සබඳතා සහිතව මෙහි ජීවත් වෙනවා. මේ තුන් පැත්තෙන්ම ආපු අතලොස්සක් දෙනා ඔවුනගේ වාසිය තකා වාර්ගික බේද අවුලුවනවා." ගැඹුරු ලෙසම යුද්ධයට විරුද්ධවූ සහ සියලු පාලක ප්‍රභූවන්ට සතුරු වූ ඔහු මෙසේ කියන්ට ඇත: "මේ යුද්ධයෙන් මැරෙන්නෙ සාමාන්‍ය දෙමල වැසියන්, අහිංසක සිංහල හා මුස්ලිම් වැසියන් සහ හමුදා සෙබලුන් විතරයි." ඔහු සසපට සහ ලෝසවෙඅට ආකර්ශනයවීම  අහම්බයක් නොවේ.

මරියදාස්ට පුද්ගලික සතුරන් සිටියේ නැත. ඔහුගේ පවුලේ සාමාජිකයින් මුල්ලිපොතානේ පදිංචියට නොයන ලෙස ඉල්ලා සිටි විට ඔහු පැවසුවේ එහි සිංහල සහ මුස්ලිම් ජනයා ඔහුගේ මිතුරන් වන බැවින් බියක් නොමැති බවයි. ඔහු මරා දැමුවේ ඔහු යුද්ධයේ ප්‍රකට විරුද්ධවාදියෙකු බැවිනි. ඝාතනය සිදු කෙරුනේ දශක දෙකකටත් වැඩි කාලයක් සමස්ත දිවයින එරී සිටින්නාවූ වාර්ගික යුද මඩ වගුරෙන් ඉවතට යාමේ ප්‍රගතිශීලී දේශපාලන මාවතක් සොයන අනෙක් අය ත්‍රස්ත කිරීමේ අරමුනෙනි.

සැප්තැම්බර් 4 වන දා සසප තඹල්ගමුව පොලීසිය ඇමතූ විට අපරාධ අංශයේ වැඩ බලන ප්‍රධානියා වන සාජන්ට් පෙරේරා පැවසුවේ පරීක්ෂකයිනට හෝඩුවාවක් සපයා ගත නොහැකි වූ බවයි. එල්ටීටීඊයෙන් කැඩී මිලිටරිය සමග එක්ව කටයුතු කරන කරුනා කන්ඩායම වැනි ත්‍රස්තවාදී කන්ඩායමක් මෙම ඝාතනය සිදු කරන්නට ඇතැයි පොලීසිය සැක කරන බව ඔහු කීවේය. එමෙන්ම මරියදාස් විසින් ආරක්ෂක හමුදාවන්ට තොරතුරු ලබා දුන්නේ යැයි සැක කොට එල්ටීටීඊය විසින් ඔහු මරා දමන්නට ඇතැයි ද පෙරේරා ඇඟවීය. වෙනත් වචනවලින් කිවහොත් පොලීසිය බැරෑරුම් පරීක්ෂනයක් සිදු නොකරයි.

සාජන්ට් පෙරේරා තව දුරටත් කියා සිටියේ විමර්ශන කටයුතු ඉදිරියට යන බව හා දෙසැම්බර් 7 දා ප්‍රාදේශීය මහේස්ත්‍රාත් අධිකරනයේ දී නඩුව නැවත ඇසීමට නියමිත බවයි. අන්තරාය වන්නේ මෙවන් අපරාධවලට ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවන් සම්බන්ධ වූ අවස්ථාවන්හි දී නැවත නැවතත් සිදුවූ පරිද්දෙන් මෙම අපරාධය සම්බන්ධයෙන් ද කුරිරු යට ගැසීමක් සංවිධානය කෙරී ගෙන යාමයි.

මරියදාස්ගේ ඝාතකයින් සොයා ඔවුනට දඬුවම් පමුනුවන ලෙස ශ්‍රී ලංකාන්ඩුවෙන් ඉල්ලා සසප සහ *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* ජාත්‍යන්තර උද්ඝෝෂනයක් දියත් කරයි. ඝාතනයට විරුද්ධත්වය ප්‍රකාශ කරමින් සහ එය පිලිබඳව පූර්න පරීක්ෂනයක් පවත්වා වගකිවයුතු සියලු දෙනා අත් අඩංගුවට ගෙන ඔවුන් චූදිතයන් බවට පත් කරන ලෙස ඉල්ලමින් ශ්‍රී ලංකාවේ අධිකාරින්ට ලිපි යවන ලෙස අපි අපගේ සියලු පාඨකයින්ගෙන් හා ආධාරකරුවන්ගෙන් ඉල්ලා සිටිමු.

විරෝධතා ලිපි පහත ලිපිනයට යොමු කරන්න:

පොලිස්පති චන්ද්‍රා ප්‍රනාන්දු,
පොලිස් මූලස්ථානය,
කොලඹ 01, ශ්‍රී ලංකාව.
ෆැක්ස්: 0094-11-2446174
ඊමේල්: igp@police.lk

නීතිපති කේ.සී.කමලසබේසන්,
නීතිපති දෙපාර්තමේන්තුව,
කොලඹ 12. ශ්‍රී ලංකාව.
ෆැක්ස්: 0094-11-2436421

ලිපිවල පිටපත් ශ්‍රී ලංකාවේ සසපට ද ලෝසවෙඅට ද එවන්න.

සමාජවාදී සමානතා පක්ෂය,
තැ.පෙ 1270,
කොලඹ. ශ්‍රී ලංකාව.